# <u>ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඔප්පු පිටපත් ඉදිරිපත් කිරීමේදී සැලකිය යුතු කරුණු</u>

**දැව හෙලීම්, දැව ප්‍රවාහන, ව්‍යාපාර නාම ලියාපදිංචිය, ඛනිජ ද්‍රව්‍ය කැණීම හා ප්‍රවාහනය වැනි කටයුතු වලදී මහජනතාව ග්‍රාම නිලධාරීන් විසින් සහතිත කළ ඔප්පුවල පිටපත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඉදිරිපත් කරනු ලැබේ. එහිදී පහත කරණු පිලිබඳ අවධානය යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලමි**

- **ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඉදිරිපත් කල යුත්තේ ඉඩමට අදාළ ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයේ පත්ඉරුවක ලියාපදිංචි කරනලද ඔප්පු පමණි**

- **ඔප්පුවේ හිමිකරු මියගොස් ඇති අවස්ථාවක**
  - උරුමකරුවන් පිළිබඳ වාර්ථාවක් ග්‍රාම නිලධාරි වෙතින් ලබා ගත යුතුය
  - අවශ්‍ය විටෙක උරුමකරුවන් පිළිබඳ දිවුරුම් ප්‍රකාශයක් ග්‍රාම නිලධාරි වෙත ඉදිරිපත් කළ යුතුය
  - සියළු උරුමකරුවන් අදාළ කරුණ සම්බන්ධයෙන් සිය එකඟතාවය ග්‍රාම නිලධාරි ඉදිරියේ ලබා දිය යුතුය

- **ඔප්පුවේ දැක්වෙන ඉඩමේ කොටසක් බැහැර කර ඇතිවිට**
  - ඉඩම් කොටස බැහැර කිරීමට අදාළ ඔප්පු හෝ මාස 3ක් තුළ ලබාගත් පත්ඉරු ග්‍රාම නිලධාරි වෙත ඉදිරිපත් කළ යුතුය

- **ඉඩම බැංකුවකට හෝ වෙනත් මූල්‍ය ආයතනයකට උගස් කර ඇති විට**
  - අදාළ කරුණ සම්බන්ධයෙන් බැංකුවේ හෝ අදාළ මූල්‍ය ආයතනයේ ලිඛිත එකඟතාවය ඉදිරිපත් කළ යුතුය
  - අදාළ බැංකුවේ ශාඛාවේ කළමණාකරු විසින් සහතික කළ ඔප්පුවේ ඡායාපිටපතක් ඉදිරිපත් කළ යුතුය

- **ඔප්පුවේ ජීවිතභුක්තියක් ඇතිවිට**
  - ජීවිතභුක්තිකරුගේ කැමැත්ත ග්‍රාම නිලධාරි ඉදිරියේ ලබා දිය යුතුය
  - ජීවිතභුක්තිකරු මියගොස් තිබේනම් මරණ සහතිකය හෝ එම මරණය සම්බන්ව ග්‍රාම නිලධාරි වාර්ථාවක් ලබා දිය යුතුය

- **ඔප්පුව පාර්ශව කිහිපයකට ලියා ඇතිවිට**
  - අනෙක් හවුල්කරුවන්ගේ කැමැත්ත ග්‍රාම නිලධාරි ඉදිරියේ ලබා දිය යුතුය
  - පාර්ශවකරුවෙකු මියගොස් තිබේනම් මරණ සහතිකය හෝ එම මරණය සම්බන්ව ග්‍රාම නිලධාරි වාර්ථාවක් ලබා දිය යුතුය.
  - එසේම එම පාර්ශවකරුගේ උරුමකරුවන් පිලිබඳව ග්‍රාම නිලධාරි වාර්ථාවක් ලබා දිය යුතුය
  - එම උරුමකරුවන් සිය කැමැත්ත ග්‍රාම නිලධාරි ඉදිරියේ ලබා දිය යුතුය

- **බෙදුම් නඩුවක් පවතින අවස්ථාවක (අවසන් නඩු තීන්දුව ලබා දීමට ප්‍රථම) ලියූ ඔප්පුවක් ඇති විට**
  - අවසන් නඩු තීන්දුව ලබා දී තිබේනම් එම නඩු තීන්දුවේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතුය
  - අවසන් නඩු තීන්දුව ලබා දී නොමැතිනම් දිසා අධිකරණයට මෝසමක් ඉදිරිපත් කර අවශ්‍ය කරුණ සම්බන්ධයෙන් දිසා අධිකරණයේ අවසරය ලබා තිබිය යුතුය

- **ඉඩමකට බෙදුම් නඩුවක් පවතින අවස්ථාවක**
    - දිසා අධිකරණයට මෝසමක් ඉදිරිපත් කර අවශ්‍ය කරුණු සම්බන්ධයෙන් දිසා අධිකරණයේ අවසරය ලබා තිබිය යුතුය

- **ඔප්පුවේ හිමිකරු විදේශගත වී ඇතිවිට**
    - ඔප්පුවේ සඳහන් ඉඩම පිලිබඳව ඇටෝර්නි බලය පවරා ඇති පුද්ගලයා ඉල්ලීම ඉදිරිපත් කළ යුතුය
    - නැතහොත් ඔප්පුවේ හිමිකරු විදේශගත වී රටෙහි තනාපති කාර්යාලයේ බලයලත් නිලධාරියෙකු ඉදිරියේ අදාළ කටයුත්තට කැමත්ත පල ලිපියක් ඉදිරිපත් කළ යුතුය
    - ඉඩමේ පදිංචිකරුවන් සම්බන්ධ ග්‍රාම නිලධාරි වාර්ථාවක් ලබා දිය යුතුය

- **ඉඩමේ හිමිකරු මියගිය අවස්ථාවක**
    - ඉඩමේ අනෙක් හවුල්කරුවන් සම්බන්ධ ග්‍රාම නිලධාරි වාර්ථාවක් ලබා දිය යුතුය
    - අනෙක් හවුල්කරුවන්ගේ කැමැත්ත ග්‍රාම නිලධාරි ඉදිරියේ ලබා දිය යුතුය

- **වරද නිවරද කිරීමේ ඔප්පුවක් ඇතිවිට**
    - වරද නිවරද කිරීමේ ඔප්පුවට අමතරව, වරද සහිත මුල් ඔප්පුව ග්‍රාම නිලධාරි වෙත ඉදිරිපත් කර එහි ග්‍රාම නිලධාරි සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතුය

- **අයිතිය අත්හැරීමේ ඔප්පුවක් ඇතිවිට**
    - අයිතිය අත්හැරීමේ ඔප්පුවට අමතරව අදාළ මුල් ඔප්පුව ග්‍රාම නිලධාරි වෙත ඉදිරිපත් කර එහි ග්‍රාම නිලධාරි සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතුය

- **ඔප්පුවක දෙවන පිටපතක් පමණක් ඇතිවිට**
    - ඉඩමට අදාල පත්ඉරු ඉදිරිපත් කළ යුතුය